# ශ්‍රී ලංකා නීති විද්‍යාල පොදු ප්‍රවේශ විභාගය

## 2026 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම

ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ 2026 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කරගැනීම සඳහා 2025 මාර්තු 17 වන දින පෙ.ව 9.00 සිට 2025 අප්‍රේල් 16 වන දින ප.ව. 9.00 දක්වා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් කැඳවනු ලැබේ.

**ඇතුළත්වීමේ සුදුසුකම්**

ශ්‍රී ලංකා නීති විද්‍යාල ප්‍රවේශ විභාගයට පෙනී සිටීම සඳහා තිබිය යුතු අවම සුදුසුකම් මෙසේය:

(අ) ශ්‍රී ලංකා අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී හෝ එක්සත් රාජධානියේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී එකවර සම්මාන සාමර්ථ්‍ය දෙකක් සහ සාමාන්‍ය සාමර්ථ්‍ය එකක් සහිතව සමත්ව තිබීම.

සහ

(ආ) ශ්‍රී ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ ජාතික පොදු සහතික පත්‍ර විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සහ සිංහල හෝ දෙමළ භාෂාව යන විෂයන් සඳහා සම්මාන සාමර්ථ්‍ය තිබීම ;

(ඇ) අයදුම්පත් භාරගැනීම අවසන් වන දිනට අයදුම්කරුවන් වයස අවුරුදු 17 සම්පූර්ණ කර තිබිය යුතුය.

*වැඩිදුර විස්තර සහ වෙනත් සුදුසුකම් සඳහා කරුණාකර ශ්‍රී ලංකා නීති විද්‍යාලයීය වෙබ් අඩවියට පිවිසෙන්න.* (www.sllc.ac.lk)

**ප්‍රවේශ විභාගය**

සියලු අයදුම්කරුවන් 2025 ජූලි මස පැවැත්වීමට නියමිත ප්‍රවේශ විභාගය සඳහා පෙනී සිටිය යුතුයි.
නීති විද්‍යාල ප්‍රවේශ විභාගය සඳහා අන්තර්ගත වන ප්‍රශ්න පත්‍ර මෙසේය.

| | | |
|---|---|---|
| 1. සාමාන්‍ය දැනීම | - | කාලය පැය 01 |
| 2. සාමාන්‍ය බුද්ධිය | - | කාලය පැය 01 |
| 3. ඉංග්‍රීසි භාෂා හැකියාව | - | කාලය පැය 1 1/2 |
| 4. සිංහල හෝ දෙමළ භාෂා හැකියාව | - | කාලය පැය 1 ½ |

**විභාග ගාස්තු සහ නීති විද්‍යාල ගාස්තු**

විභාග ගාස්තුව රු 1200/= කි. විභාග ගාස්තු ගෙවීමේ ක්‍රමවේද පිළිබඳ උපදෙස් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

නීති විද්‍යාල ගාස්තුව රු 12,000/= කි. එම මුදල හැටන් නැෂනල් බැංකුවේ සංස්ථාගත නීති අධ්‍යාපන සභාව නමින් ඇති 063020073300 (අලුත්කඩේ ශාඛාව) වෙත අයදුම්කරුගේ නමින් ගෙවා අදාළ රිසිට්පත entrance@sllc.ac.lk යන ඊමේල් ලිපිනයට යොමු කිරීමෙන් පසු පමණක් තම අයදුම්පත මාර්ගගත ක්‍රමය ඔස්සේ විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය. *(නීති විද්‍යාලය වෙත ඊමේල් කරනු ලබන රිසිට්පතෙහි විභාග අයදුම්කරුගේ මුලකුරු සහිත නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ දුරකථන අංකය අනිවාර්යයෙන් පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය.)*

**අයදුම් කිරීමේ ක්‍රමය**

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our services" යටතේ ඇති "Online Applications – Recruitment Exam/EB Exams" ඔස්සේ පළ කර ඇති අතර, අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ මාර්ගගත (Online) ක්‍රමය මගිනි.

*සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළ වන මෙම නිවේදනය භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.*

විදුහල්පති,
ශ්‍රී ලංකා නීති විද්‍යාලය,
අලුත්කඩේ වීදිය,